# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ මනෝවිද්‍යාවේ මූලාශ්‍රය අධ්‍යයනය හා බෞද්ධ මනෝ - කායික විශ්ලේෂණයෙහි මූලිකාංග BUPS – 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනයෙහි ලා බෞද්ධ අදහස් අන්තර්ගත සූත්‍ර දේශනාවක් වශයෙන් මිගසාල සූත්‍රය අගයන්න.

02. කර්මය සහ පුද්ගල චර්යාව අතර සබඳතාව බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පෙන්වා දෙන්න.

03. "පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමෙහිලා උපයෝගී කරගත හැකි වටිනා බෞද්ධ උපදේශයන් මහාරාහුලෝවාද සූත්‍රයෙහි අන්තර්ගත වේ." විමසන්න.

04. තමා ඇසුරෙන්ම සත්ත්වයා හා බාහිර ලෝකය පිළිබඳව යථාර්ථය තේරුම් ගත හැකි බව රෝහිතස්ස සූත්‍රය මගින් පෙන්වා දී ඇති ආකාරය පරීක්ෂා කරන්න.

05. ප්‍රියයන්ගෙන් වෙන්වීම නිසා ඇතිවන මානසික පීඩාවන් සමනය කර ගැනීම පිණිස තිරෝකුඩ්ඩ සූත්‍රාගත ඉගැන්වීම් කෙතෙක්දුරට වැදගත් වන්නේ දැයි අධ්‍යයනයක යෙදෙන්න.

06. පුද්ගලයා තුළ ජනිත වන විවිධ මානසික වෙනස්වීම් විපල්ලාස සූත්‍රය පදනම් කරගෙන විස්තර කරන්න.

07. බෞද්ධ සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායෙහි අන්තර්ගත මනෝවිද්‍යාත්මක පදනම පැහැදිලි කරන්න.

08. වර්තමාන සමාජයෙහි දැකගත හැකි සමාජ ගැටලු නිරාකරණය කිරීම සඳහා බුදුසමයාගත මූලික ඉගැන්වීම් යොදාගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

09. සංජානනය (Perception) යන්න හඳුන්වා ඉන්ද්‍රිය සංජානනයේ ගැටලු පුද්ගල පෞරුෂය සඳහා බලපානු ලබන ආකාරය විමසීමට ලක්කරන්න.

10. "පපඤ්ච" යන්නෙහි අර්ථය පැහැදිලි කොට සසර පැවැත්ම සඳහා තත් සංකල්පය හේතු වන ආකාරය පහදන්න.

***********************************